

# ගේය පද විවරණ

දෙහන්සා හුලංගමුව

# ගේය පද විවරණ

*මතකයේ රැඳුණු සොඳුරු ගී වල හෘදයාංගම ආමන්ත්‍රණය*

**දෙහන්සා හුලංගමුව**

ගේය පද විවරණ

© දෙහන්සා හුලංගමුව

ISBN : 978-624-208-702-3

කෘතිය පළ කළ දිනය : 2025 පෙබරවාරි

# පිදුම

*සෑම සලකුණක ම*
*අරුත සොයා*
*ඇදෙන,*
*කුතුහලයට*
*ඉඩ දෙන*
*සහෘද ගී රසවින්දකයන්*
*සියලු දෙනාට…*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම එයට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදායය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් ම හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවදියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# <u>පටුන</u>

1. බලා වැලපෙමි නෙළාගනු බැරි හන්තාන සිහිනේ - 01

2. අපි හැඟුම්වලට - 04

3. හන්තානට පායන හඳ - 07

4. රුදුරු තුරු වදුලේ - 10

# 1. බලා වැලපෙමි නෙළාගනු බැරි හන්තාන සිහිනේ

ජානක සිරිවර්ධන මහතා අතින් පබැඳී, අරුණ ගුණවර්ධන මහතා අතින් සංගීතවත් වුණු මෙම "බලා වැලපෙමි නෙලාගනු බැරි හන්තාන සිහිනේ" ගීතය ජනතාව අතර මෙතරම් ජනාදරයට පාත්‍ර වීමට හේතුව එය ගායනයට ලක් වූ හඬ පෞර්ෂ ද්විත්වය බව කා අතරත් නොරහසක්. පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේවයන් සහ උමාරියා සිංහවංශ අතින් වර්ණවත් වුණු මෙම ගීය කවුරුත් ඇතුළත් වීමට සිහින මවන පේරාදෙණිය විශ්වවිද්‍යාලය වටා ගෙතුණු කතාන්දරයක් පාදක කොටගෙන නිර්මිතයි.

*"බලා වැලපෙමි - නෙළාගනු බැරි - හන්තාන සිහිනේ"*

මෙම පදය ගායනා කරන්නේ යුවතියක්, ගීතයට අනුව නම් උමාරියා සිංහවංශ මහත්මිය. ගීතය පිළිබඳ වැඩි අදහසක් නොමැති බොහෝ දෙනාගේ මතය නම් මැය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට වරම් නොලද හෙයින් තම ශෝකය ප්‍රකාශ කරන බවයි. නමුත් පදවැලට හොඳින් අවධානය යොමු කරද්දී අපිට තේරෙනවා මේ කතා කරන්නේ විශ්වවිද්‍යාල සිහිනය බොඳ වීමක් පිළිබඳව නම් නොවන බව. මේ තරුණිය කතා කරන්නේ තමන්ගේ විශ්වවිද්‍යාල ප්‍රේමය සම්බන්ධව. මේ ප්‍රේමයේ විශේෂත්වය නම් මේ තරුණිය පෙම් බඳින්නේ එම විශ්වවිද්‍යාලයේ ම ආචාර්යවරයෙකුට. මෙහිදී ඇයට හඬා වැලපීමට සිදු වන්නේත් එම සිහිනය නෙළා ගැනුමට නොහැකි වන්නේත් ඒ ආචාර්යවරයා මේ තරුණියට වඩා වයසින් ඉතා වැඩිමහල් වීම නිසයි.

*"දරා නෙත් අග - දොවා සිත් මල - ගොතනු මැන ළඳුනේ - හන්තාන සිහිනේ"*

යට කී තරුණියට තමා පිළිබඳ අදහස අතහැර ඇගේ හන්තාන සිහිනය ගොඩ නගන ලෙස තමයි මෙම ආචාර්යවරයාගේ නම් උපදේශය. අපි හැමෝම පිය නගන්න සිහින මවන භූමියක් තමයි පේරාදෙණිය සරසවිය කියන්නෙ. ඉතින් මේ ආචාර්යවරයාට හිතෙන්නේ, තමා වැනි අයකුට පෙම් බඳින මේ තරුණිය ඇගේ මේ

විශ්වවිද්‍යාල ගමන තමන් නිසා විනාශ කරගනී කියන සැකයයි. මොකද මේ ආචාර්යවරයාට තේරෙනවා මේ තරුණිය හඹා යන්නේ මිරිඟුවක් පසුපස බව. මොකද වයස් පරතරය නිසා ම මේ ගුරුවරයා මේ යෝජනාවට කිසිසේත් කැමැත්තක් දක්වන්නේ නැහැ.

*“වැහි පබළු යට - රඟ මඬල මැද - ඔබේ දෑතේ තුරුලු වෙන්නට”*

මේ තරුණිය මේ ඇදුරන්ට කොතරම් බැඳී ඇතිද කියා ඉහත පද පෙළ සාක්ෂ්‍ය දරනවා. මේ ගීයේ පදවැලට අනුව ගී විචාරකයින්ගේ අදහස මෙම ආදර සබඳතාව කලා අංශයේ රංගන පීඨය ආශ්‍රිතව ගොඩනැගුනක් බවයි. තමාව මේ ආචාර්යවරයා ප්‍රතික්ෂේප කළත් මේ තරුණියට අවශ්‍ය අඩු තරමේ විශ්වවිද්‍යාල රඟ මඬලේ දී වත් ඔහු හා එක්ව සිටීමට; රංගනයකට පමණක් වුවද ඔහුගේ උණුහුමේ කාලය ගත කිරීමට.

*“බිසෝ හැර ගිය - ළසෝ රඟහළ - අමාවක අඳුරේ - නොඑනු මැන ළඳුනේ”*

මේ ආචාර්යවරයා මේ තරුණියව ප්‍රතික්ෂේප කිරීමට එකම හේතුව වයස් පරතරය පමණක් නොවන බවට ඉඟියක් මේ පද පේළියෙන් සැපයෙනවා. ඔව්, සමහර විට මේ ආචාර්යවරයා තම බිරිඳ විසින් ප්‍රතික්ෂේප වනු ලැබුවෙක්, නැතිනම් බිරිඳ මළ වැන්දඹු පුරුෂයෙක්. ඒ කුමන හේතුව මත වුවත් මේ ආචාර්යවරයාට අවශ්‍යතාවයක් නැහැ මේ තරුණියව තමා වැනි විවාහයෙන් අසාර්ථක වුණු පුද්ගලයකු සතු වනු දැකීමට. ඈට තමාට වඩා හොඳ සහකරුවකු මුණගැසී ඇගේ ජීවිතය තමාට හැකි පමණට වඩා හොඳින් ගත කරවීමත් මේ ආචාර්යවරයාගේ බලාපොරොත්තුවක්.

*“වඩින තුරු සඳ - දුරින් ඉන්නම් - තරු ඇදුරු පෙම් - ගී අහන්නම්”*

ඔව්, මේ තරුණිය ලේසියෙන් පරාජය භාර ගැනීමටනම් සූදානම් නැහැ. ඇදුරුතුමාගේ අඳුරු අතීතය ඇගේ මුල් බැසගත් පිවිතුරු ප්‍රේමයට බාධාවක් නොවේ. කවදා හෝ මේ ආචාර්යවරයාගේ සිත වෙනස් වී, ඇය වෙනුවෙන් ප්‍රේමයක් හටගන්නා තුරු ඇය බලා සිටීමට සූදානම්.

*"සොඳුරු ඒ සඳ - දියේ එන්නම් - හිඳිනු මැන සොඳුරේ - හන්තාන අරණේ"*

ඇදුරුතුමා මේ තරුණියට කොතරම් කරුණු පහදා දී ප්‍රතික්ෂේප කිරීමට සූදානම් වුවත් ඇගේ මේ ස්ථිර වචන හමුවේ ඔහුගේ සිතත් මොළොක් වීමට පටන්ගන්නවා. තරුණියගේ අනාගතය ගැන සිතා ඇයව ප්‍රතික්ෂේප කිරීමට සැරසුනත් මේ ආචාර්යවරයාගේ ද සිතේ ඇය පිළිබඳ පෙම් කැකුළක් පිබිදීගෙන එනවා. අවසානයේ තම හැඟීම් සමග පොර බැදීම නවතා ඔහු තීරණය කරනවා මේ තරුණියට තමා පිළිබඳ බලාපොරොත්තුවක් ලබා දීමට. ඉතින් ඔහු පවසන්නේ තම හැඟීම් ඇය වෙතට සම්පූර්ණයෙන් හරවාගෙන පැමිණෙන තුරු හන්තාන අරණට වී කාලය ගත කරන ලෙසට. ඒ ගත කරන කාලය වැඩි දවසක් නොයා ම මේ තරුණිය වෙතට පැමිණිය යුතු බවයි මගේ අදහස නම්.

# 2. අපි හැඟුම්වලට

ප්‍රේමකීර්ති ද අල්විස් මහතා අතින් රචනය වී වික්ටර් රත්නායක මහතා අතින් හඬ සහ සංගීතය එක්ව නිම වූ විශිෂ්ට නිර්මාණයකි, "අපි හැඟුම්වලට" ගීතය. ආදරයේ කිමිදෙන්නෙකුට ඊළඟට ඇති වන හැඟීම රාගයයි. තම මගහැරුණු පෙම්වතිය කෙරෙහි උපන් ප්‍රේමයත්, රාගයත් පිළිබඳ ගැයෙන සුමදුර ගීයක් ලෙසින් මෙම ගීතය දැක්විය හැකියි.

*"අපි හැඟුම්වලට ඉඩ දී මොහොතක් - ඉඩ ලබා ගනිමු තරමින් වියතක්"*

මේ ප්‍රේමවන්තයාගේ මේ ඇරයුම තම පෙම්වතියට, තම රාගී හැඟීම්වලට ඉඩක් ලබා දීමට.

*"හඳපානේ - මද අඳුරේ - අත් පටලා යමු ආයේ"*

මිනිස්සුන්ට තම හැඟීම්වලට ඉඩ දීමට හොඳ ම වෙලාව රාත්‍රී කාලයයි. මිනිසුන්ගේ රාගී හැඟීම් අවදි වීමට සුදුසු ම කාලය රාත්‍රියයි. ඉතින් මේ ප්‍රේමවන්තයාගේ අදහස තම පෙම්වතිය සමඟ මේ රාත්‍රියේ දී තම කාමුක හැඟීම්වල රස විදීමට.

*"ඔබ ඔබෙ හෙවනැල්ලෙන් මිදී - මම මගෙ හෙවනැල්ලෙන් මිදී"*

මේ පෙම්වතාට තම පෙම්වතියත්, මේ පෙම්වතියට මේ පෙම්වතාත් මඟ හැරී ඇති බවට ඉඟියක් මේ පද පෙළෙන් සැපයෙනවා. කිසියම් කාන්තාවකට හෝ පුරුෂයෙකුට තම හෙවනැල්ල මෙන් ළඟින් සිටින්නේ තම විවාහක සහකරු හෝ සහකාරිය; එනම් තම බිරිඳ හෝ සැමියා. මේ ගීතයේ කථකයා තම පෙම්වතියට ඇරයුම් කරන්නේ ඇගේ විවාහක සැමියාගෙන් මිදී මේ රාත්‍රියට පමණක් තමා හමුවට පැමිණෙන ලෙසටයි. මෙය සමාජ සම්මතයට පටහැනි දෙයක් ලෙස අපි හැමෝටම වැටහෙනවා. නමුත් මේ යුවලගේ කෝණයෙන් බැලූ කළ ඔවුන්ට මේ හැර වෙන විකල්පයක් කොයින්ද? සමහර විට මේ ඔවුන්ගේ දෙමාපියන්ගේ තේරීමට නොගැළපුනු දෙදෙනෙක්, එහෙමත් නැතිනම් කේන්දර, ග්‍රහ පිහිටීම් වලට අනුව නොගැළපුණු ආදරවන්තයින් දෙපළක් වෙන්න පුලුවන්. ඉතින් කෙසේ හෝ තමාට මගහැරුණු ඒ සොඳුරු හෝරා කිහිපය ලබා ගැනීමට තමයි මේ යුවතියට ලැබෙන ආරාධනය.

*“අවුදින් හෙමින් - රහසින් මුමුණා - හදපානේ - මද අඳුරේ”*

මේ රාත්‍රියේ මේ ගමන පිටත් වීමේ දී මේ තරුණිය කෙතරම් ප්‍රවේශම් විය යුතු ද යන්න මේ තරුණයා අවධාරණය කර සිටිනවා. හෙමින් ඇවිදින්, රහසින් මුමුණා ආපහු රාත්‍රිය අවසන් වීමට මත්තෙන් මේ යුවළ නැවත තම නිවෙස් කරා යා යුතුයි. හුදෙක් ගීතය පමණක් රස විඳින අපට මොවුන් පත් වී ඇති තත්ත්වය පිළිබඳ අනුකම්පාවක් ඇති වුණත් මොවුන්ගේ මේ හමුවීම සැබෑ ජීවිතයේ දී හමුවන සුලබ සමාජ ගැටලුවක්. තම විවාහක සැමියා හෝ බිරිඳ සිටිය දී වෙනත් කෙනෙකුගේ පහස සොයා යාම සමාජයේ පිළිකුලට භාජනය වන කරුණක්. ඉතින් මේ කතා කරන තරුණයාට අවශ්‍යතාවයක් නැහැ තමන්ටවත් තමන්ගේ පෙම්වතියටවත් එවන් දෝෂාරෝපණ සමාජයෙන් එල්ල වනවා දැකීමට. ඉතින් මොහුගේ අදහස රාත්‍රියේ ම හමු වී රාත්‍රියේ ම වෙන් වී යාමටයි.

*“හිර කර හසරැල්ලෙන් හැඬුම් - අපි හිනැහෙමු සපුරා පැතුම්”*

ඉතින් මේ යුවල බලාපොරොත්තුවෙන් සිටි ඒ රාත්‍රිය උදා වුණා. ඔවුන් මුණගැසුණා. නමුත් එය සිතූ තරම් සොඳුරු රාත්‍රියක් නො වුණා. මොකද මේ තරුණියට තම හෘද සාක්ෂ්‍යයට පටහැණිව තම සැමියාට කරන වංචාවක් ලෙසින් ඇගේ මේ හැසිරීම පිළිබඳ දුකක් හටගැනුණා. ඉතින් සෑම කාන්තාවක මෙන් ම ඇයටත් මේ වෙලේ ඇගේ කඳුලු වලින් පැන යාමට නොහැකි වුණා. ඉතින් මේ තරුණයාටත් ඇගේ මේ තත්ත්වය තේරුම් යනවා. ඉතින් ඇයව සනසන්නට ඔහු කියන්නේ මේ හැඬුම් සිනහවලින් හිර කර දමා ඔවුන්ගේ මේ හමුවීමට හේතු වූ පැතුම සපුරමු කියලයි. ඔවුන් බාහිර බලපෑම් හේතුවෙන් වෙන් වී සිටියත් ඔවුන් අතර ඇති මේ අන්‍යෝන්‍ය වටහා ගැනීම කෙතරම් දුරට ශක්තිමත් ද යන වග මෙමගින් පැහැදිලි වෙනවා. අතීතයේ මොවුන්ගේ වෙන් වීමට හේතු වූ යම් දෙය සිදු නොවූයේ නම් මේ මොහොතේදී ත් මොවුන් තම විවාහක දිවිය සතුටින් ගත කරන අඹු-සැමි යුවලක් බවට පත් වීමට ඉඩ තිබුණා.

*“මතු ආත්මයේ - හමුවන පැතුමින් - යමු වෙන් වී - හිමිදිරියේ”*

යට කී පරිදි ඔවුන් එම රාත්‍රියේ හමු වී ඔවුන්ගේ පැතුම් ඉටු කරගෙන නැවතත් වෙන් වී යන මොහොත එළඹී තිබෙනවා. තමාට මේ භවයේ දී අතිනත ගැනීමට නොහැකි වුවත් ඊළඟ ආත්මයේ දී වත් හමු වී යුග දිවියට එළඹීමට අවස්ථාවක් ලැබෙනැයි යන පැතුමින් හිමිදිරිය උදා වීමත් සමග මොවුන් දෙදෙනා වෙන් වී යනවා.

*“හඳපානේ - මඳ අඳුරේ - අත් පටලා යමු ආයේ”*

මේ ආදරවන්තයින් දෙපළගේ එක ම ප්‍රාර්ථනය නම් කවදා කෙසේ හෝ තමාට තම ආදරය නිදහසේ විඳීමට ඉඩ හසර ලැබේ යයි යන්නයි.

සියුම් ලෙස පදවැල් ගළපමින් ප්‍රේමකීර්ති ද අල්විස් මහතා මේ සමාජයට ලබා දීමට යන අදහස නම් කාගෙවත් බලපෑමකට හසුව තම ජීවිතය ම කඩාකප්පල් කර නොගත යුතු බවයි. නැතිනම් සිදුවන්නේ මේ ගීතයේ සඳහන් ප්‍රේමවන්තයින් මෙන් ‘අනියම්’ යන නාමයෙන් තම ආදර ජීවිතය රැගෙන යාමට සිදු වන බවයි.

# 3. හන්තානට පායන හඳ

තරුණ-මහලු සියලු දෙනාගේ ආදරයට පාත්‍ර වුණු සොඳුරු ගීයකි, අමරසිරි පීරිස් මහතාගේ ප්‍රතාපවත් හඬින් අලංකාරවත් වුණු "හන්තානට පායන හඳ" ගීතය. ධම්මික බණ්ඩාර මහතා අතින් පබැඳුණු මේ ගීතය සොඳුරු තනුවකින් අලංකාර කරන ලද්දේ ඩැනිස්ටර් පෙරේරා මහතා ය. මෙම ගීතයෙහි කථකයා නම්, පේරාදෙණි විශ්වවිද්‍යාලයට වරම් නො ලද තරුණයෙකි; ප්‍රේමවන්තයෙකි.

*"හන්තානට පායන හඳ*
*ලස්සනයිද කියන්න*
*මා නො දකින ඒ පුරහඳ*
*ඔබට හැකිය දකින්න"*

කළින් සඳහන් කළ පරිදි මේ ගීතයෙන් කතා කරන්නේ කාගේත් සිහිනයක් වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට නොහැකි වූ තරුණයෙක්. පාරිසරික සෞන්දර්යය නිසා ම ජනප්‍රියත්වයට පත් පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ලංකාවේ අධ්‍යාපනය හදාරන ඕනෑම සිසුවකුගේ සිහිනයක් බව නො රහසක්. ඉතින් මේ තරුණයා පවසන්නේ තමාට එම හන්තානට පායන සඳ දැකබලා ගැනීමට අවස්ථාවක් නැති බවයි. නමුත් ඔහු විමසනවා, බොහෝ විට ඔහුගේ පෙම්වතියගෙන් ඒ සඳ ලස්සනයි ද යන වග. එහි අදහස නම් මොහුට නොහැකි වුවත්, ඇයට හැකිව තිබෙනවා හන්තාන සරසවි වරම් හිමි කරගැනීමට. ගීතයේ තනුවට අනුව මේ තරුණයාගේ සිතේ කොනක මේ සිහිනය බොඳ වීම පිළිබඳ යම් කනස්සල්ලක් ගැබ්ව තිබෙන බව හැඟවෙනවා. නමුත් ඔහුට සතුටු වීමට හේතුවක් තිබෙනවා, ඔහුගේ පෙම්වතිය මෙම සරසවියට ඇතුළත් වීම. ඊළඟ පද පේළි තුළින් ඔහු ඔහුගේ කතාව තම පෙම්වතියට පවසනවා.

*"අඳුරු ලලා වහිනා කළ*
*සරසවි බිම තෙමෙන්න*
*කුඩේ යටින් ඔබ යන කළ*
*එපා තනිය දැනෙන්න"*

ඕනෑම දෙයක් හෝ ස්ථානයක් සොඳුරු වුණු පළියට එහි අසුන්දර ස්ථාන නොමැති බව සිතීම නම් මුලා වීමක්. මේ තරුණයා පවසන්නේ හන්තාන අරණට වුවද එවැනි අසුන්දර අවස්ථා පැමිණිය හැකි බවයි. මෙහි "අඳුරු ලලා" යනුවෙන් අදහස් කර තිබෙන්නේ, මෙම සරසවියට ඇතුළත් වූ තරුණියට විඳීමට සිදු වන දුක් කම්කටොලු ය. තම උසස් අධ්‍යාපනය නොකඩවා ඉදිරියට ගෙනයාම පිළිබඳව, තම පවුලේ හෝ තමාගේ ආර්ථික ගැටලු පිළිබඳව, යහලු මිත්‍රාදීන් පිළිබඳව ගැටලු බොහොමයකට මුහුණ දීමට ඕනෑම විශ්වවිද්‍යාල සිසුවකුට සිදු වෙනවා. නමුත් යෞවන වියේ පසුවන මෙම සිසුන්ට ඒ ගැටලුවලට එක්ව මුහුණ දීමට ශක්තිමත් ආදරයක් බොහෝ විට මේ වන විට හමුවෙනවා. නමුත් මේ තරුණයා පසුතැවෙන්නේ තමාට තම පෙම්වතියට එම ජීවන අභියෝගවලට මුහුණ දීමට ශක්තියක් වීමට තමාට අවස්ථාවක් නොලැබෙන බව දන්නා නිසා. ඉතින් එම අඳුරු ලලා වහින අවස්ථාවල දී කුඩේ යටින් තනියම යාමට සිදු වන තම පෙම්වතියට තනිකමක් නොදැනෙන ලෙසට ඔහු ප්‍රර්ථනා කරනවා.

*"ලතා මඬුලු අත වනාවි*<br>
*එපා අහක බලන්න*<br>
*මා ගැන මතකය ගුලිකර*<br>
*මහවැලියට දමන්න"*

යට කී පරිදි තම පෙම්වතියගේ තනිකම පිළිබඳ හිතමින් පසු වන මෙම තරුණයාට අදහසක් පහළ වෙනවා. එනම්, තමා නොමැති වුවද වෙනත් කෙනෙකුට ඇගේ මේ ජීවන බර බෙදා ගැනීමට හැකියාවක් පවතින බව. මේ පද පේළියෙන් හැඟවෙන ආකාරයට මේ කථකයා පෙම් බඳින්නේ රූප සොබාවෙන් ඉතා ඉහළ තරුණියකට විය හැකියි. ඉතින් පිරිමින් වශී වන සුළු ඇගේ මේ රූපය නිසා ම ඇයට සරසවි බිම ඇතුළත සිටින තරුණ සිසුන්ගේ පෙම් ආරාධනා ලැබීමට ඉඩ තිබෙනවා. "ලතා මඬුලු අත වනාවි" යන්නෙන් ඔහු මේ තරුණියට කැමති වීමට ඉඩ ඇති තරුණයන්ව සංකේතවත් කරනවා. ඉතින් ඔහු මේ තරුණියට පවසන්නේ තමා පිළිබඳ මතකය මහවැලි ගඟට විසි කර දමන්න කියායි. මේ තරුණයා නමින් කිසිදු ප්‍රේමයක් ඇය තුළ නොමැති නම් ඇයට වෙනත් කෙනෙකුගේ අත පතා යාමට හැකි බව මේ තරුණයා වටහාගන්නවා. තම පෙමවතියගේ සතුට වෙනුවෙන් කළ හැකි අන්

කිසිවක් සිතාගත නොහැකි වූ කළ ඔහු කල්පනා කරන්නේ කෙසේ හෝ තම ආදරවන්තියට ඇගේ සිහිනය වෙත යාමට පහසු කරවීමට ඇති හොඳ ම මග එය බවයි. ඉතින් තම ආදරවන්තිය වෙනුවෙන් තම සියලු දේ කැප කිරීමට සූදානම් මෙම තරුණයා පිවිතුරු ප්‍රේමයක් හිතින් දරන සැබෑ පෙම්වතෙක් බවට නිගමනයක් ගීතය රස විඳින අප තුළ ගොඩනැගෙනවා. මෙම පදවැල නිර්මාණය කළ ධම්මික බණ්ඩාර මහතාගේ ද ප්‍රයත්නය එය වන්නට ඇති බව මම විශ්වාස කරනවා.

## 4. රුදුරු තුරු වදුලේ

ගීතවල මතුපිට අර්ථය පමණක් දැනගෙන සැබෑ අර්ථය පිළිබඳ නොදැනුවත් ව වැරදි ලෙස විචාරයට බඳුන් වූ ගීතයකි, සුනිල් එදිරිසිංහ මහතාගේ හඬින් ගැයුණු "රුදුරු තුරු වදුලේ" ගීතය. මහාචාර්ය කාලෝ ෆොන්සේකා අතින් රචිත මෙම ගීතයට ගැළපෙන ම තනුවක් එක් කර දීමට රෝහණ වීරසිංහ මහතා සමත් වී ඇත. මෙම ගීතයේ පදවැලෙහි අර්ථයට අවධානය යොමු කිරීමට පෙර මෙම ගීතයට පසුබිම සැපයුණු සිද්ධිය පිළිබඳ කතා කිරීම අගනේ යයි මම සිතනවා.

මෙම ගීතයේ පදවැල ගත් කළ බොහෝ දෙනාගේ අදහස එය පෙම්වතෙක් තම පෙම්වතියට ගායනා කරන්නක් යන බවයි. නමුත් මෙම ගීයට පසුබිම සැකසී ඇත්තේ කිසිවෙකුත් නොසිතන ආකාරයකටයි. කාලෝ ෆොන්සේකා මහතා මෙරට පැවති යුධ සමයේ දී තම පවුල සමගින් විදේශගත වීමට තීරණය කරන්නේ තම පවුලේ ආරක්ෂාව තහවුරු කරගැනීමටයි. එම කාලපරිච්ඡේදය මෙම පවුලේ සියලු දෙනාට වැඩි පීඩනයක් ගෙන දීමට සමත් වන්නේ ෆොන්සේකා මහතාගේ ආදරණීය දියණිය ඒ වන විට ගැබ්බර මවක්ව සිටීමයි. ඉතින් මෙලොව එළිය දැකීමට නියමිත තම මිණිපිරියගේත් තම දියණියගේත් ආරක්ෂාව පිළිබඳ මේ පියතුමාට සැකයක් මෙන් ම බයක් ද ඇතිවෙනවා. ඉතින් තමා කෙතරම් තම දියණියට ආදරය කරනවා ද යන වග ඇයට දැනෙන්නට සැලැස්වීමට ඔහු මෙම ගීතය රචනා කරනවා. ඉතින් සැබැවින් ම මෙය පෙම්වතෙක් තම පෙම්වතියට ගායනා කරන ආදර ගීතයක් නොව පියෙකු තම ආදරණීය දියණියට ගායනා කරන ආදර ගීතයක් බවට මෙමගින් පැහැදිලි වෙනවා.

*"රුදුරු තුරු වදුලේ - තියුණු කටු අතරේ*
*දිළෙන සියුමැලියේ*
*ඔබයි ජීවන සුවඳ දෙන්නේ - රෝස කුසුම මගේ"*

රෞද්‍ර වූ කටු සහිත ගස් තිබෙන කැලයක් වැනි සමාජයක ජීවත් වන තම සුන්දර වූ දියණියට මේ ආදරණීය පියා පවසන්නේ ඔහුට ජීවන සුවඳ ගෙන දෙන රෝස මල ඇය බවයි. පියෙකුට තම වටිනා ම වස්තුව තම

දරුවන් බව නම් නො රහසක්. ඉතින් මේ කතාව කියන පියතුමාත් තම දියණියගේ ජීවිතය තමාට හැකි උපරිමයෙන් ලස්සන කර දීමට වෙහෙසෙන පුද්ගලයෙක්. රුදුරු වූ සමාජයක ජීවත් වීමේ දී මුහුණ දීමට සිදුවන දුක් කම්කටොලු විඳ දරාගෙන ඉදිරියට යා යුතු සියුමැලිය ඔබ බව මේ පියා තම දුවට පවසනවා.

*"මහදේ රන්මුසු ගේ ඔබ තබලා - නිරන්තරේ රැකගනිමි පුබුදුවලා*
*සුවඳ විදිමින් හිඳිමි සැමදා - දෑස වැසෙන තුරා"*

මේ කතා කරන පියතුමා මෙන් ම සෑම පියෙකුගේ ම සිහිනය තම දරුවන්ගේ ජීවිතය සාර්ථක වනු දැකීමයි. ඒ සඳහා තම සියලු සැප සම්පත් කැප කර දරුවන්ව රන්මුසු ගෙයක තබා උස් මහත් කරවීම සෑම පියෙකුම සිදු කරන්නක්. ඔවුන්ව තම දිවි පරදුවට තබා රැකගන්නා මේ පියවරුන්ගේ සිහිනය තම දෑස වැසෙන තුරු තම දරුවන්ගේ ජීවිතය සාර්ථක වන අයුරු දැක ගැනීමයි; දරුවන් නම් මල්වල සුවඳ විඳීමයි.

*"මිහිරී රූසිරි - මිහිරී ජනනියේ*
*සිත සැනසේ ඔබ දසුනේ*
*මුදුමනී - මුදුමනී*
*සිත සැනසේ ඔබ දසුනේ"*

තම දියණියගේ රූ සොබාව, හැකියාවන්, ඇය ජීවිතය ජයගෙන ඇති ආකාරය දැකගෙන සිත සනසගැනීම තරම් සතුටක් පියෙකුට තවත් නොමැත. ඉතින් මේ පියාණනුත් ඔහුගේ දියණිය දෙස බලා සැනසෙන අයුරු මේ පද පෙළෙන් කියැවේ.

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජයේ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දීමට නොහැකි ය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්.